**දීප්තිඃ බලහත්කාරී වරණයේ විරුද්ධාභාෂය**

සත්‍ය ලෙසම නපුර ඇත්තේ නපුර නම් වස්තුව තුළ නොව නපුර යනුවෙන් තේරුම් ගන්නා තැනැත්තා තුළය යන හෙගෙලියානු අදහස රෝසා ලක්සම්බර්ග් හරහා මෙසේ තේරුම් ගනිමු. සංශෝධිතවාදීන් තුළ තිබූ එක්තරා බියක් වුයේ 'වාස්තවික තත්වයන්' මුහුකුරා නොගිය තත්වයක් තුළ විප්ලවය 'ඕනෑවට වඩා කලින්', අකාලයේ සිදුවීමට තිබූ හැකියාවයි. ලක්සම්බර්ගේ පිළිතුර වුයේ බලය අල්ලා ගන්නා මොහොත කොහොමටත් මුහුකුරා නොගිය මොහොතක් වන බවත්, විප්ලවීය විෂය (revolutionary subject) තම නො-මුහුකුරා ගිය බව අතික්‍රමණය කළ යුත්තේ නැත්නම් මුහුකුරා ගිය අයෙක් බවට පත්වන්නේ මුහුකුරා නොගිය උත්සාහයන් ගණනාවක්, පසුකිරිමෙන් ම පමණක් බවයි. ඇයගේ අදහස වුයේ ඒ අනුව 'නිශ්චිත අවස්ථාව' (opportune moment) එළඹෙන තුරා (නැත්නම් වාස්තවික තත්වයන්' සම්පුර්ණ වන තුරු) බලා සිටීමෙන් පමණක් එම මොහොත කිසිදා උදානොවන බවයි. මෙයින් කියවන්නේ විප්ලවීය විෂය ව්‍යවස්ථාපනය වන්නේම ක්‍රියාමාර්ගය සමඟ විෂය මුලික දුරස්තභාවය පවත්වා ගැනීමෙන් නොව ක්‍රියාමාර්ගයට සහභාගිවීමෙන්ම පමණක් බවයි. නිවැරදි මාර්ගයට එළඹිය හැක්කේ වැරදීම තුළින්ම ගමන් කිරිමෙන් පමණකි. යම්කිසි හරවත් දෙයක් සිදුවීමට නම් යමෙක් ආශාවේ පරම නොහැකියාව තිබියදීත්, එහි අඥාණ වලේ වැටිය යුතුමය. විප්ලවයේ 'අර්ථය' සම්පාදනය වන්නේම එහි මුහුකුරා නොගිය උත්සාහයන්ගේ අසාර්ථකත්වය තුළින්ම වන බැවින් විප්ලවය නැවත නැවතත් සිදුවිය යුතු බව ජිජැක් කියන්නේ එබැවිනි (ජිජැක් 2005ඃ 41).

දීප්ති යනු කවුරුදැයි ඉතාම හොඳින් එක් යුගයක තමන් විසින් දැන සිටි බැවින් ඔහු තුළ ඇති වරද- 'නපුර' (ඒකාධිපතියෙකු වීමට ඇති සිහිනය!) පිළිබඳව තමා දැනුවත් යැයි දක්වමින් විවේචනය කරන බොහෝ පැරණි x සාමාජිකයින් හට අමතකව ඇති කරුණ නම් 'වරද සැමවිටම සත්‍යයට අන්තරාවර්තී වන' බවයි (error is always immanent to the truth). පවත්නා පසු-ධනේෂ්වර තත්වයන් තුළ දේශපාලනය කිරීම නම් උත්සාහය තුළ ක්‍රමාණුකුල සංවිධිත පක්ෂ ව්‍යුහයක් නිෂ්පාදනය කර ගැනීමට ඔහු කල (ලිබරල් නොවන) උත්සාහය තුළ ඔහුට අත්හැර දැමීමට සිදුවන විවිධ පෞරුෂයන් විසින් ඔහුට එරෙහිව නඟන චෝදනාවන්හි හරය සමපාත වන්නේ ඉහත සංශෝධිතවාදීන්ගේ හිස්ටෙරික- මායා ආකල්පයට ය. විවිධ පෞරුෂයන් සංවිධාන ව්‍යුහයට අවශෝෂණය කර ගනිමින් ඔවුන්ගේ පෞරුෂ - සංස්කෘතික අනන්‍යතාවයන්ට හා රසිකත්වයන්ට නිදහසේ ක්‍රියාත්මක වන්නට ඉඩහැරියා නම් දීප්තිට ඇත්ත වශයෙන් මීට වඩා ජනප්‍රිය ආකෘතියක් සහිත නායකත්වයක් බවට පත්වීමට පසුගිය වසර දහයක පමණ කාලය තුළ උවමනාවටත් වඩා ඉඩකඩ තිබුණි. නමුත් ඔහු තෝරා ගත්තේ 'බාහිරෙන් සමුද්දේශනය වීම හරහා නෛතිකකරණය' (external point of reference of legitimation) වෙනුවට 'මා ඔබගේ නායකයා වන හෙයින් මාව අනුගමනය කරන්න' යන ශිර්ෂ පාඨයයි. නමුත් ඉහත ජනප්‍රිය 'නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩහැරීමේ' ආකෘතිය අනුගමනය කළේ නම් සිදුවිය හැකිව තිබූ න්‍යායික ප්‍රවේශය නම් 'මා තුළ කිසිවක් නැත. මා පවතින්නේ ඔබගේ කැමැත්ත ප්‍රකාශ වන ආකෘතියක් ලෙස පමණි' (ජිජැක් 1989ඃ 164) යන ස්ථාවරයයි. දීප්ති ඒකාධිපතියකු වීමට සිහින මවනවා යනුවෙන් චෝදනා කරන අයට නොතේරෙන කරුණ නම් සත්‍ය සමස්තතාවාදී (totalitarian) ලක්ෂණ පෙන්නුම කරන්නේ දෙවැනි නිදහස් මොඩලය තුළ යන්නය. (එක්තරා ආකාරයකට වර්තමාන පාලන මොඩලය මෙවැන්නකි). ඉදින් දීප්ති තෝරාගත් බාහිරෙන් අනන්‍යතාවය නෛතිකකරණය කර ගැනීමේ ආකෘතිය අත්හැරීම නම් සංකේතීය දේශපාලන පියවර අද දවසේ දේශපාලනය සඳහා අතවශ්‍ය සාධකයක් ලෙස දී ඇති කොන්දේසිය තුළ ඔහුගේ 'නපුර' නියත වශයෙන් සත්‍ය හා අන්තරාවර්තී වන බව 'සුවිශේෂී නියෝජනයක් ලෙස ගොනු වූ ඒකමතිකත්වයක් ලෙස මහජනයා (people) යන්න නොපවතින

බවට' වන ලැකානියානු ප්‍රකාශයට සමගාමීව කොතරම් දැවැන්ත සත්‍යයක් වේද? දීප්ති සම්බන්දයෙන් පාර-භාෂාවක්[1] අවශ්‍ය වන්නේ මෙම විරුද්ධාභාෂී නිමේෂයේ ය.

දීප්ති තේරුම් ගැනීමට නොහැකි වීම නිසා නොයෙක් ආකාරයේ න්‍යායික මෙන්ම අශ්ශීල ප්‍රශ්න අසන්නන්ගේ අඩුවක් තවමත් නොමැති විම ගැන දශකයකට පමණ පසුවත් ලිවීම අවශ්‍ය වී ඇතැයි සිතමි. මෙම නොතේරීමට ප්‍රධාන හේතුව නම් ඔහු සම්බන්දයෙන් ඉහත සදහන් පාර-භාෂාවක් (metalanguage) නිර්මාණය වී නොමැති වීමය. වෙනත් විදියකින් කිවහොත් දීප්ති තේරුම් ගැනීමට ඇත්තේ ද අප එදිනෙදා භාවිතා කරන භාෂාව ම වීමය. ලැකානියානු ෆැලික හැඟවුම තේරුම් ගැනීම සඳහා පාර-භාෂාව ප්‍රකට කරන නොහැකියාව (impossibility of metalanguage) ගැන සඳහන් කරන ස්ලොවෝයි ජිජැක් එවන් 'පාර භාෂාවක් නොපවතින' බව සඳහන් කරන්නේ සියලු පාර භාෂාවන්හි ශුන්‍ය තලය යනු එදිනෙදා භාෂාව පෙරළා සියලු පාර භාෂාවන්හි අවසන් අර්ථකතනය බවට පත්වීම යැයි සඳහන් කරයි (ජිජැක් 1989: 177). සාමාන්‍ය පාර-භාෂාවේ භාෂාව එයම බවට පත්වීම නිසා සිදුවන්නේ සාමාන්‍ය භාෂාව ස්වයං-සමුද්දේශකයක් බවට පත්වීම නොහොත් ස්වයංක්‍රිය පරාවර්තික ව්‍යාපාරයක ස්වරූපය ගැනීමය. සාමාන්‍ය බොලොග්කරුවන්ට තේරුම් යන භාෂාවකට මෙය සරලකරණය කළහොත් අවසානයට සිදුවන්නේ දීප්තිටම දීප්ති ගැන ලිවීමට සිදු වීමය. එම කරුණ නිසා අදවන විට සිදු වී ඇත්තේ 'ශුද්ධ වස්තු-භාෂාවක්' (pure object-language) නොමැතිවීම නිසා දීප්ති විසින් ස්වයං-දුරස්තභාවයක් (self-distance) රඳවා ගෙන යන බවට වන ව්‍යාජ විඥාණය අධිනිශ්චය වීම හරහා දීප්ති එක්තරා අකාරයක අර්චන (fetish) ස්වරූපයක් ගෙන තිබීමය.

දීප්ති සම්බන්යෙන් අද වනවිට බිහිවන දෘෂ්ඨිමය ප්‍රචණ්ඩත්වයකන් යුත් ලිපි ලේඛනවල දක්නට ඇත්තේ 'දීප්ති යනු මෙයයි' නැත්නම් 'දීප්ති යනු මෙය නොවන දෙයයි' ය කොට්ඨාශ දෙකට අයිති වන රචනාය. පළමුවැන්න තුළ දීප්තිගේ පෞද්ගලික ජීවිතය එළිදරව් කිරීම ඔස්සේ 'දීප්ති මෙන්ම මේ වගේ' යැයි ඍනාත්මකව දක්වනු ලබන අතර, දෙවැන්න තුළ 'මහ ලොකුවට ශිෂ්ටත්වය ගැන කතා කරපු දීප්තිගේ වැඩ මෙන්න' යැයි නිශේධනාත්මකව ප්‍රකාශ කිරීමට උත්සාහ කරයි. නමුත් අන්තර්ගතය (content) තුලින් 'දීප්ති නම් වස්තුව' නියෝජනය නොකිරිම තුල නැති වූ වස්තුව නිසා හටගනු ලබන හිස්භාවයකින් මෙම ලිපි පිරී යයි. මේ තත්වය අප ජනප්‍රිය උදාහරණයක් ඔස්සේ පැහදිලි කර ගනිමු. වරක් මොස්කව්හි චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹීමට ගිය රසිකයෙක් එක් චිත්‍රයක කෘප්ස්කායා (ලෙනින්ගේ බිරිඳ) කොමොසමෝහි තරුණ සාමාජිකයෙක් සමඟ නිදි යහනේ සිටින අයුරු නිරූපනය කර ඇති චිත්‍රයක් දෙස බලා එහි තේමා පාඨය ගැන විමසීමක් කළේය. එහි සඳහන්ව තිබුණේ 'ලෙනින් වර්සෝ හි' යනුවෙනි. නරඹන්නාගේ ප්‍රශ්නය වුයේ කෝ මෙතන ලෙනින් නැහැනේ' යනුවෙනි. එහි දී මඟ පෙන්වන්නාගේ පිළිතුර වුයේ 'ලෙනින් ඉන්නේ වර්සෝවෙනේ' යනුවෙනි. (ලෙනින් වර්සෝ ගිය අවස්ථාවේ කෘප්ස්කායා තරුණ කොමොසමෝ කාඩර්වරයෙකු සමඟ යහන් ගත වී ඇති බව නිරූපණය වන බව මෙහි අර්ථයයි). මෙහි දී චිත්‍රයේ නැති දෙය නම් ලෙනින් යන වස්තුවයි.

---

1 පාර-භාෂාවක් යනු පරිකල්පනීය අඩවියක් නොව, දැඩි ලැකානියානු අර්ථයකින් 'යථ' කි. එය තම ස්ථානයේ 'පදිංචිවීමට' නොහැකියාවක් දක්වයි. එසේම එය මඟහැර සිටීමටත් නොහැකි වේ. යමෙකුට එය බවට පත්වීමට (attain) නොහැකිවන්නා සේම එම මඟහැරීමට ද (escape) නොහැක. මේ නිසා 'යථ' මඟහැර සිටීම යනු තම නොහැකියාව ද්‍රව්‍යමය කරන්නා වූ ශුද්ධ පාර-භාෂාවක ප්‍රකාශනයක් (utterance) නිෂ්පාදනය කර ගැනීමට සිදුවීමය. එවිට එවන් පාර භාෂාවකට පරම අනේකත්වයක් (absolute otherness), විරුද්ධාභාෂී ලෙස, තම අනන්‍යතාවය වශයෙන් නිපදවා ගත හැකිය.

නැත්නම් නියෝජනය අභිමිවීමෙන් හටගන්නා හිස්භාවය පිරවීමට උත්සහ කරන අනුප්‍රාප්තිකත්වය නම් තත්වයට 'සියල්ලම නියෝජනය කළ නොහැකි වීම' නම් ෆ්‍රොයිඩියානු විරුද්ධාභාෂයයි. දීප්ති වෙනුවට ඔහු වැනි අය බිහිකිරීමට පශ්චාත්-X කණ්ඩායම් ව්‍යාපෘතිය උත්සාහ කළ ද එය අද දක්වා සාර්ථක නොවීමේ හේතුව (හා එම නිසාම දීප්ති විනාශ කිරීමට උත්සහ ගැනීමේ තත්වය ද) බද්ධ වී ඇත්තේ මෙම නියෝජනයේ නොහැකියාව (impossibility in representation) පිළිබඳ රෝග ලක්‍ෂණයේ ය. සියල්ලන්ටම මේ දක්වා ලඟාවිය හැකිව ඇති වැඩිම දුර නම් චිත්‍රයේ සිටිනා තරුණ කොම්සමොල් තරුණයාගේ ස්ථානයටයි. සත්‍ය වශයෙන් ඔවුන් නිවැරදිය: 'දීප්ති සිටිනුයේ වර්සෝහි' ය. දුරස්තභාවය එතරම්ම වැඩිය.

හැමෝම සිතමින් සිටින්නේ චිත්‍රයේ ශිර්ෂ පාඨය ඉවත් විය යුතුයි යනුවෙන් වුව ද ඇත්තවශයෙන් ඉවත් විය යුත්තේ ශිර්ෂ පාඨය විසින් විතැන් කර ඇති වස්තුව වේ.

දීප්ති දැකීමට අවශ්‍යම අය කළ යුත්තේ එම අවශ්‍යතාවය පැන නැගීමට ඇති හේතුව දෙස බැලීමයි. 'දීප්ති යනු කවුද?' යන්න වර නැගීමට අවශ්‍ය වන්නේම කුමන දේශපාලනික කරුණක් නිසාවෙන්ද යන පැණයට පිළිතුරු සෙවීමයි. 'මේ දීප්ති නොවේ' යැයි අපට පෙනෙන්නේ ඇයි යන්න පැහැදිලි කර ගැනීමට තවත් කතාවක් දෙසට යොමු වෙමු. එක්තරා බලහත්කාරයෙන් හමුදාවට බඳවා ගත් යුද හමුදා භටයෙකු හමුදාව හැර යාමට ව්‍යාජ හේතුවක් සොයමින් (සුනාමිය දා දීප්ති හැරයාම සඳහා හේතු සෙවූ අය මෙන්) ඔහු කළේ කිසියම් දෙයක් සොයන බවට අභිරූපණය කරමින් 'මෙක නොවෙයි නේ ඒක' යනුවෙන් දිගින් දිගටම හමුවන සෑම වස්තුවක්ම මඟ හැර යෑමය. කිසිදා හමුනොවන මෙම 'දෙය' දිගටම සොයන ව්‍යාජයෙන් දිගටම ඔහු කියා සිටියේ 'මේ තමා සොයන දෙය නොවේ' යනුවෙනි. අවසානයේ හමුදා මනෝ වෛද්‍යවරයා තිරණය කළේ මෙම හමුදා භටයා රෝගියෙකු බවත් ඔහු හමුදාවෙන් විශ්‍රාම ගැන්විය යුතු බවත්ය. අවසානයේ හමුදාවෙන් ඉවත් කළ ලිපිය ඔහු අතට පත් කළ වහාම ඉතා සන්තෝෂයෙන් ඔහු ලිපිය දෙස බලා කියා සිටියේ 'අම්මට සිරි මේ තියෙන්නෙ මම හොයපු එක යස අපුරුවට' යනුවෙනි. දීප්ති වෙනුවට වෙනත් දේශපාලනික අනුප්‍රාප්තිකයෙක් (ස්වාමියෙක්) සෙවීම යනු ම මෙම හමුදා භටයා කළ රඟපෑම මෙන් වූ ව්‍යාජ මානසික රංගනයකි. හමුදා භටයා තමා සොයමින් සිටියේ කුමක් ද යන්න හොඳින් දැන සිටියේ ය. ඔහුට අවශ්‍ය වූයේ හමුදාව හැර යෑමටයි. ඔහු 'යමක්' සොයන වේශයෙන්, දිගින් දිගට සොයන දෙය හමු නොවීමේ 'අසාර්ථකභාවය' ඔස්සේම, තමාට අවශ්‍ය දෙය 'සාර්ථකව' සොයා ගනී. කිසිදා අනුප්‍රාප්තිකයෙක් (substitute) සොයාගත නොහැකි බව දැන දැනත් එම 'අසාර්ථකභාවය' තුළින්ම දීප්ති හැරගිය අයට අවශ්‍ය වූයේම 'සාර්ථකව' ඔහු හැර යාමටයි. ලාංකික දේශපාලනය තුළට මෙන්ම අපගේ පරම්පරාවට 'දැනුම' හා 'හැදෑරීම' ඔස්සේ ගැඹුරු දේශපාලනයක නිරත විට හැකි බව පෙන්වා දුන් අපගේ පරම්පරාවේ විශිෂ්ඨතමයා ලෙස අද දවසේ හැඳින්විය හැකි දීප්ති කුමාර ගුණරත්න නම් දේශපාලන ක්‍රියාකාරිකයා සහ චින්තකයා නිර්මාණය කල සංකේතීය විශ්වය දරා ගත් ඔහුගේ භෞතික ශරීරය සාර්ථකව අතික්‍රමණය කිරීමට කෙසේ වෙතත් ඔහු හැරදා ගියවුන්ට ඔහුට 'සාර්ථකව' අමතක කිරීමටවත් නොහැකි වීම සරදමක් වන්නේ කෙසේ ද යන්න ඔහුව හෙලා දකිමින් අද දවස දක්වා ඔහුට එරෙහිව කරන අවලාද වලින් මොනවට පැහැදිලි වේ. අඩු ගණනේ පෙර සඳහන් හමුදා භටයා අවසානයේ දී හමුදාව හැරයාමට හැකිවීම ගැන 'සතුටු වුයේය'. දීප්ති හැරගිය අයට එම විපරීත සතුට වත් හිමි වී ඇත් ද?

පෙර සඳහන් හමුදා භටයාගේ 'සෙවීමේ' ව්‍යායාමය (දීප්ති හැරයෑමට හේතු සෙවීම) විරුද්ධාභාෂයක් (paradx) වන්නේ කෙසේ ද? (මෙය රනිල් වික්‍රමසිංහ හැරගොස් විවිධ 'හේතු' නිෂ්පාදනය කරන අයට ද අදාලය). මෙහි දී ඉස්මතු වන රෝග ලක්‍ෂණය කුමක් ද? මෙම හමුදා භටයා සොයමින් සිටීමේ ක්‍රියාව ම තමා සොයන දෙයෙහි

'හේතුව' නිෂ්පාදනය කිරීමයි. වෙනත් විදියකින් කිවහොත් කිසිම දිනක හමුනොවන දෙයම (නොතිබෙන බව තමා දැන ගනිමින්ම සොයන දෙය) තමා සොයන දෙයෙහි හේතුව බවට මෙහි දී පත්වීමයි. දීප්ති යනුවෙන් අප සොයන දෙය කිසිදා හමුවීමට ඉඩක් නැති දෙයක් ලෙස අප දිගටම කියමින් සිටින්නේ එබැවිනි. දීප්ති යනුම අප පරිකල්පනයේ මේ වනවිටත් සිටින සංකේතීය දේශපාලන ක්‍රියාධරයා වේ. ඔහු සෙවීම සඳහා අප කරන උත්සහය යනු ලැකානියානු ආශාවේ වස්තු-හේතුව (object-cause of desire) හා නියත සාන්ද්‍රෂ්‍යයක් සම්පාදනය කරයි. දීප්ති හැරගිය අයගේ ලේඛන හරහා අප සොයමින් සිටින්නේ මේ කිසිදා 'හමුනොවන' බව අප දැන දැනත් එහෙත් අර හමුදා හටයා මෙන් පලා යැමට අවශ්‍ය හේතුව නොවේ ද? ඉහත බලහත්කාරයෙන් හමුදාවට බඳවා ගත් තැනැත්තා වටා සිටින, මනෝ විශ්ලේෂකයා ද ඇතුලත්, සියලුම අය විසින් අමතක කර ඇති කාරණාව නම් හමුදා හටයාගේ 'පිස්සු ක්‍රීඩාවේ' කොටසක් බවට තමන් ද මේ වනවිටම පත්ව ඇති බවට වන කොන්දේසි යයි. (ජිජැක්: 2008: 180). අන්තර්ජාලයේ දීප්තිට එරෙහිව නඟන අවලාද අප කියවන විටම (කවුරුවත් ඒවා බැරෑරුම් ලෙස නොගන්නවා වුවද) අප ඉහත කී 'පිස්සු ක්‍රීඩාවේ' කොටසක් බවට නිරායාසයෙන්ම පත්වන බවට සහසුද්ධයෙන්ම දන්නේ කිහිප දෙනෙක් පමණි. ඒ දීප්ති විසින් එළියට දමන ද කල්ලියේ 'තමාට අවශ්‍ය කුමක් දැයි තමා නොදන්නා' (එහෙත් තමාට අවශ්‍ය දෙය දීප්ති දන්නවා යැයි අනුමාන කරමින් දේශපාලන කිරිමට පැමිණි) හිස්ටෙරික නියුරෝසිකයන්ය. හිස්ටෙරික නියුරෝසිකයා සෑමවිටම 'නිවැරදි වස්තුව' (the right object) සෙවීම සඳහා වේගවත් උත්සාහයක් දරයි. නමුත් ඒ සෑම විටම 'මේ තමා සොයන දෙය නොවේ' යැයි (this is not that) කියා එය අතහරිනු ලබන්නේ එම වස්තුව හරහා ඔහුට/ඇයට ලබා ගත හැකි විනෝදයේ සීමාවද ඔහු/ඇය එමවිටම සලකුණු කර ගන්නා බැවිණි (නමුත් ග්‍රස්තික නියුරෝසිකයා මෙයට ප්‍රතිපක්ෂව වස්තුවේ 'ඕනෑවටත් වඩා' විනෝදයක් දකී. එම නිසා වස්තුවේ අතිරික්ත (සීමාව ඉක්මවා යන) පරිපූර්ණත්වය නිසා වස්තුන දරා සිටීමට අපොහොසත් භාවයක් දක්වන බැවින් වස්තුව අභිමුඛවීම කල් දමයි).

සොයා ගැනීමට අපහසු දෙයක් දීප්ති තුළ සැඟවී ඇතැයි අප කරන අනුමානයම මේ අනුව මිත්‍යාවකි. ඇත්ත වශයෙන්ම කාරණය නම් දේශපාලනය හැර සැඟවීමට කිසිවක් දීප්ති තුළ නොමැතිවීමය. නැත්නම් සඟවා ඇති දෙය නම් සැඟවීමට කිසිවක් නොමැති බව සඟවා ගෙන සිටීම නම් ක්‍රියාවයි. නමුත් දීප්තිට අවලාද නගන්නවුන් දිගින් දිගට ඉස්මතු කරමින් පවතින්නේ දීප්ති යන අන්තර්ගතය සහ ඔවුන් පරිකල්පනය කරන දීප්ති කෙනෙක් අතර වන පාර-භාෂා දුරස්තභාවයයි. ඒ සෑමවිටම ඔවුන් හට කියවෙන්නේ හා ඉදිරියේත් කීමට ශේෂව ඇත්තේ 'මේ එය නොවේය' යන වගන්නතිය පමණි.

ලාංකික හිස්ටෙරික නියුරෝසිකයින්ගේ එකම ගැටළුව පොරොත්තුවීමට (waiting) ඇති නොහැකියාවයි. ජාතිවාදය මතින් ඒකාධිපතිත්වයක් කරා ජනප්‍රිය ගමනක යෙදෙන වර්තමාන රෙජීමය පෙරළා දැමීමට හදිස්සි වී ඇති අය රනිල් නොයිවසනවා මෙන්ම සමාජවාදය ඇති කිරිමට හදිසි වී ඇති අයට ද (සාම්ප්‍රදායික වාමාංශිකයින් මෙන්ම රැඩිකල් පශ්චාත්-වාමාංශිකයින් ද) දීප්ති නොරුස්සන්නේ ඔවුන් පවත්නා ධනේශ්වර දේශපාලනික තත්වයන්ගේ කොන්දේසි තේරුම් නොගෙන ඇතිවාට අමතරව ඔවුන් හිස්ටෙරික නියුරෝසික ලක්ෂණ ප්‍රකට කර නිසාවෙනි.

> 'හිස්ටරික නියුරෝසිකයා හට පොරොත්තුවීම ඔරොත්තු දෙන්නේ නැත:, ඔහු ඔහුවම 'පසුකර යෑම' ඔස්සේ වේගවත් වන අතර, මෙම නොයිවසිල්ල නිසාම ඔහුට ආශාවේ වස්තුව මගහැරී යයි. ඔහුට අවශ්‍ය වන්නේ හැකිතරම් ඉක්මනට එය අත්පත් කර ගැනීමටයි' (ජිජැක් 2008:218)

දීප්ති අතහැර ගොස් ඉතා ඉක්මනට වාමාංශික දේශපාලනය ස්ථාපිත කිරීම සඳහා ඉතා වේගවත් ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වූ අයහට සිදු වී ඇති අකරතැබ්බය දෙස බැලුවිට මෙම ජිජැකියානු අර්තකථනය කොතරම් අදාල දැයි දැන් ඔබට පෙනෙනු ඇත. ඒ සඳහා ඔවුන් තෝරාගත් 'වෙනස' පෙරටුගාමී සමාජවාදීන් විසින් රෝග ලක්ෂණයක් වන තෙක් ඉදිරියට ගෙන ගියේය. අවසානයේ එම ව්‍යායාමය අවසන් වූයේ, සම්ප්‍රදායික ජනතා විමුක්ති පෙරමුණටත් වඩා දේශපාලන ගතානුගතිකත්වයකට (විශේෂයෙන් ජාතික ගැටළුව සම්බන්ධයෙන්) ඔවුන් ගමන් කරවමිනි.

දේශපාලන පක්ෂයක් තුළ විනයගතව දේශපාලනය කිරිම අතහැර ගිය අය එක්තරා ආකාරයක මරණයකට ගොදුරු වූ බව අපගේ විශ්වාසය යි. නැපෝලියන් පළමුව පරාජය අත්කර ගෙන එල්බා වලට (Elba) කොටු වූ විට ඔහු පළමුවරට මිය ගියේ ය. නමුත් ඔහු මේ වන විටත් මියගොස් ඇති බවත් ඔහුගේ ඓතිහාසික භූමිකාව අවසන් බවත් ඔහු දැන සිටියේ නැත. එය ඔහුට අවබෝධ කර දුන්නේ අවසන් වෝටර්ලූ පරාජය යි. එම මොහොතේ ඔහුගේ දෙවන මරණය හමුවේ, නැපෝලියන් සත්‍ය ලෙසම මිය ගියේ ය. මෙය ජනප්‍රිය සංස්කෘතියේ උදාහරණයක් මගින් නැවතත් පැහැදිලි කර ගනිමු. ටොම් ඇන්ඩ් ජෙරී කාටුන් චිත්‍රපටිවල පූසා සහ මීයා ගැන මොහොතක් සිතන්න. ඩයිනමයිට් අතේ පත්තු වී පුපුරා ගිය පසුවත්, ගල්රෝලට අසුවී රොටියක් වූ පසුවත් නැවත නැවතත් පූසා අප ඉදිරියේ සාමාන්‍ය අයුරින් විද්‍යාමාන වේ. මෙම නැවත ඉපදීමේ ක්‍රීඩාවේ කොන්දේසිය නම් අදාල ප්‍රාණියාහට ප්‍රාණයන් ගණනක් ඇති බවට වන පිළිගැනීමයි. ඉදින් මේ ප්‍රාණකරුවන් මියගියා වුවද මේ නව ක්‍රිඩාවේ කොන්දේසි තුළ නැවත නැවත එක් එක් ආකාරයේ අවලාද ලිපි හරහා ප්‍රාණය ලබන බව අප තේරුම් ගෙන ඇත්තෙමු. දැන් කල යුත්තේ කුමක් ද?

මරණයේ සීනුව දෙවරක් නාද නොවුවද මරණ දෙකක් ඇති බව, ජිජැක් තම 'ඔබ දෙවරක් පමණක් මියයයි' (You only die twice) යන ලිපියේ සඳහන් කර සිටී. ඔහු සඳහන් කරන මරණ දෙකෙහි වෙනස කවරේ ද? ඉහත දැක් වූ නැපෝලියන් උදාහරණයේ මෙන් පළමු අවස්ථාවේ දී මාගේ ප්‍රාණයන්ගෙන් එකක් මට අහිමි වෙයි (එක්කෝ ගල් රෝලට යටවේ නැත්නම් ඩයිනමයිට් අතේ පුපුරා යයි) දෙවන අවස්ථාවේ දී මට මගේ ක්‍රීඩාව ම අහිමි වී යයි (I lose the game itself). ලැකාන් මෙම වෙනස ශාරීරික මරණය හා සංකේතීය මරණය ලෙස නම් කරන අතර (ජිජැක් 2008: 150) සංකේතීය ලෙස තමා මියගිය බව අවබෝධ කර ගැනීමට (නැපෝලියන්ට මෙන්) යම් කිසි කාලයක් යම් පුද්ගලයෙකුට අවශ්‍ය වේ. මේ සඳහා නැවතත් අප කාටුන් උදාහරණයට හැරෙමු. ටොම් ඇන්ඩ් ජෙරී කාටුන් වල පූසා මහා ප්‍රපාතයක අවසානයට ලංවූ පසුත් එක්තරා දුරක් හිස් අවකාශයේ ගමන් කරයි. ටික වේලාවක් සාමාන්‍ය පරිදි ගමන් කරන පූසා එක්වරම තමාගේ දෙපතුල්වලට යටින් තවදුරටත් මහ පොළොව නොපවතින බව අවබෝධ කරගත් විට හෙතෙම වැටීම ආරම්භ වේ. නමුත් එම අවබෝධය නොමැතිව තම දෙපතුලට යටින් පොළව නොතිබුණා වුව ද පූසා වැටෙන්නේ නැත. ඌ තවදුරටත් ගුවනේ ගමන් කරයි. එයට හේතුව නම් සොබාදහමේ නීතියට තමන් අවනත විය යුතු බවට වන නියමය ඔහුට අමතකව තිබීමයි. බොහෝ අයට තමා සංකේතීයව මියගොස් ඇති බව පෙන්වා දෙන තුරු ඔවුන් එය අමතකව ගුවනේ ගමන් කරමින් සිටින කෙටි විරාමය මෙය බව අපගේ අවබෝධයයි. ජිජැක් මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නේ ඔහු මියගිය බව ඔහු නොදන්නා බැවින් එය ඔහුට/ඇයට සිහිපත් කර දිය යුතුය යන්නය. එනිසා මිය යෑමට අමතක නොකරන්න! යැයි අප කාරුණිකව ඔවුන්ට මතක්කර දෙන්නෙමු.

අප අද දිවි ගෙවමින් ඇත්තේ කුමන වූ සමාජයක ද? එක් අතකින් සමාජීය විනයගතභාවය හා බල අධිකාරය විසින් පාලනය කරනු ලබන අපගේ ආශාව 'මර්ධනය' කරනු ලැබීම පිළිබඳ හඬ (voice) සහ අනෙක් අතින්

අපගේ ස්වයං-වින්දනය (self-enjoying) හරහා ඇති කරගත් විමුක්තියක් පිළිබඳව වූ 'සමතික්‍රමණය' (transgression) පිළිබඳ හඬ විසින් ඉරා දමනු ලබන නීතිය හා පිළිවෙල අතර වූ විරුද්ධාභාෂයකය (paradox). එම නිසා ලිඛිත නීතිය හා එහි අශ්ශීලත්වය පිළිබඳ බෙදුම රැඩිකල් අවිනිශ්චිතාවයකට ගමන් කර ඇති මොහොතකි මෙය. වෙනත් විදියකින් කිවහොත් මතට තිත යනු සත්‍යම ලිඛිත නීතියක් හරහා වන සමාජය නියාමනය කිරීමක් ද නැත්නම් 'හොරෙන් ටිකක් බිව්වාට කමක් නැතැයි' පවසන අශ්ශීල විනෝද අතිරික්තයක් ද යන්න අද වන විට අතිශයින් අපහැදිලි තත්වයක පවතී. (සිගරට් පිළිබඳ නීතිය ද මේ අයුරින්ම ව්‍යුහගත වී ඇත). දේශපාලනය විනයගතව, ක්‍රමානුකූලව, සංයමයෙන් යුතුව කිරීම දේශපාලන පක්ෂයක පැවැත්ම නම් දෘෂ්ටියෙන් ගත් විට අතිශයින්ම දුෂ්කර ක්‍රියාවක් වී ඇත්තේ මෙම විරුද්ධාභාෂී පසු-ධනේශ්වර, අශ්ශීල, පාර-නෛතික අතිරික්ත විනෝදය (obscene paralegal supplement) නම් නව තත්වය නිසාය. ඉහත සඳහන් තත්වයන් දෙක අතර ජීවත්වීමට මෙම පසු-ධනේශ්වර සමාජය අපට බලකර ඇත. නැත්නම් එය බලහාත්කාරී වරණයක් (forced choice) ලෙස අප ඉදිරියේ ඇත.

බලහත්කාරී වරණය යන්න අප තවදුරටත් තේරුම් ගැනීමේ පහසුව සඳහා 'සොෆීගේ වරණය' (Sophie's Choice) නම් ජනප්‍රිය නවකතාව දෙස හැරෙමු. විලියම් ස්ටයිරන් (William Styron) විසින් 1979 වසරේ රචිත මෙම නවකතාවේ ප්‍රධාන චරිතය වන පෝලන්ත ජාතික සොෆී තම රෝගී මවට ආහාර රැගෙන එන අතරතුරේ නාසී සෙබළුන් විසින් අල්ලා ගන්නා ලදුව වධ කඳවුරකට දමන ලදී. එහිදී ඇයට නාසින් විසින් අණ කරන්නේ ඇයගේ දරුවන් දෙදෙනාගෙන් එක් අයෙකු මරණය සඳහා කැප කරන ලෙසයි. මවක් ලෙස එක් දරුවෙකු හෝ මරණයට පැමිණිවීමට එකඟවීම කොතරම් දුෂ්කර හා නොවිය හැකි (impossible) තත්වයක් යන්න මෙහිදී සොෆීගේ චරිතයට අදාලව නවකතාකරු පෙන්වා දෙයි. අවසානයේ තම හත්හැවිදිරි දියණිය එම මරණය සඳහා ඇය තෝරා ගන්නා අතර එම වරදකාරීත්වයෙන් ඇයට කිසිදා ගැලවිය නොහැකි වන බව නවකතාකරු ප්‍රකාශ කර සිටී. වරණයක් ලෙස අපට මෙය පෙනී ගියද ඇත්ත වශයෙන් එය වරණයක් වශයෙන් තේරුම් ගත නොහැක. අවම වශයෙන් සාන්දෘෂ්ටිකවාදී අර්ථයෙන් ගත්ත ද මිනිසාගේ වරණය ස්වඡන්දතාවය (freewill) නැත්නම් තෝරා ගැනීමට පුද්ගලයෙකුට ඇති කොන්දේසි විරහිත නිදහස මත රඳා පවතී.

සොෆී හට ඇති තෝරා ගැනීමේ අවස්ථාව මේ වනවිටත් ඇය මත බලෙන් ආරෝපණය කර ඇති බැවින් තේරීම (වරණය) මේ වනවිටත් අත්‍යාවශයෙන් තවත් කොන්දේසි මත යැපීමේ (dependent) තත්වයකට යටත් වේ.

> නිදහසේ තෝරා ගැනීම යනුවෙන් ඇති අදහසම ප්‍රතික්ෂේප කිරීම සඳහා ම ඇති හිස් සංකේතීය අභිනයකි. එකක් යනු අනිකේ ප්‍රතිවෘත්තය වන්නේය. එනම්, කිසිදා අනිවාර්යෙන්ම සිදු නොවන අසම්භාව්‍යයේ තේරීම නම් සම්භාව්‍යයේ පිරිනැමීම මෙම හිස් අභිනය සිදු කරයි. (ජිජැක්, 2005: 275)

ලාංකික වාමාංශික දේශපාලන සන්දර්භයක් තුළ 'දීප්ති වෙනුවට ඇති තෝරා ගැනීම' යන ප්‍රකාශයම හිස් අභිනයක් වන්නේ ඔහුව හිලව් කිරීම සඳහා (replace) වන සංකේතීය පෞරුෂයක් අන් කෙනෙක් විසින් ආදර්ශනය (demonstrate) කර නැති නිසාය. මෙම තත්වය පශ්චාත් නිදහස් ලාංකික දේශපාලනය විසින් අප මත ඇත්ත වශයෙන් බලහත්කාරීව (එහෙත් සංකේතීයව) පටවා ඇති තත්වයකි. (වෙනත් වචනයෙන් කිවහොත් දීප්ති වෙනුවට කෙනෙක් පැමිණෙන්නේ නම් හෝ තෝරා ගැනීමට ඇත්නම් ඇතැම් විට යහපත් විය හැකි වනු ඇත යන්නය). නමුත් එවැන්නක් නැතිවීම තුළ ඇත්තේ දීප්ති පමණක් වීම තුළ ඔහුව තෝරා ගැනීම යනු දීප්ති සම්බන්දයෙන් අනුප්‍රාප්තිකත්වයක් නැතිවීම ගැන තවත් කතාවක් කීමට අදහස් කරමි. රැකියාවේ උසස්වීමක්

සම්බන්දයෙන් මාගේ මිතුරෙකු සමග ඉතා දරුණු තරගකාරීත්වයක් ඇති අවස්ථාවක මා දිනුවා යැයි සිතමු. නමුත් මිත්‍රත්වයේ නාමයෙන් මා එයින් ඉවත් වුවොත් එය මගේ මිතුරාට ලැබෙනු ඇත. එමෙන්ම මගේ මිතුරා ද මාගේ එම ඉවත්වීම නිසා ඇතිවන පුරප්පාඩුවට නොගොසින් මාගේ පිරිනැමීම ප්‍රතික්ෂේප කරනු ඇත. මේ ආකාරයෙන් අපට අපගේ මිත්‍රත්වය රැක ගැනීමට හැකි වේ. නමුත් ඇත්ත වශයෙන් මාගේ ඉවත්වීම නිසා හටගන්නා පුරප්පාඩුවට මගේ මිතුරා අයදුම් කර එම අවස්ථාව ලබා ගතහොත්? එවිට ඇතිවන තත්වය නම් සමාජ පිළිවෙලහි සම්භාසය (semblance) බිඳවැටී විනාශයක් කරා ගමන් කිරීමය. උදාහරණ ලෙස චන්ද දිගින් දිගටම පැරදීම නිසා රනිල්ට ඉවත්වන්න යැයි කියන්නන් විසින් අපේක්ෂා කරන්නේ කුමක් ද? බලයට ඇති කෑදරකම යන අවුල් සහගත තත්වය සමනය කරනු වස් රනිල්ට අවශ්‍ය නම් ඉවත්විය හැක. මේ තත්වය ගැන රනිල් නොදැනුවත් නොවේ. නමුත් සත්‍ය වශයෙන් ඇති ගැටළුව නම් තෝරා ගැනීමට සැබෑ විකල්පයක් නැතිවීමය. විවේචනය කිරීම සඳහා ඇති අයිතිය යනු කොමියුනිස් පක්‍ෂ සන්දර්භයක් තුළ පෙරළා එම තීරණයන්ට 'එසේය' යනුවෙන් පැවසීමය. පශ්චාත් නූතන ලිබරල් නිදහසක් දක්නට නැති එවන් තත්වයක් තුළ ඔවුන් පවත්වා ගෙන යෑමට උත්සහ කළේ පෙර සඳහන් කළ පිළිවෙළෙහි සම්භාසය (stats of semblance) නම් තත්වයයි.

බලය යන්න සත්‍ය වශයෙන් ක්‍රියාත්මකවීමට නම් වාරණය (injunction) යන්න විරුද්ධාභාෂී ලෙස මහජනයාට පෙනෙන සීමාවෙන් ඔබ්බෙහි ලිඛිත-නොවන ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතුය. නිශ්චිත සංවිධාන ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක නොවන අයෙකුට මෙය නොතේරිය හැකි වුවද දේශපාලන පක්‍ෂයක් ක්‍රියාත්මක වන්නේ යම් අලිඛිත අශ්ශීල අන්තර්ගතයක් ද සහිතවය. ඉහත රැකියාවේ උසස්වීම පිළිබඳ කතාවේ ද මිතුරන් දෙදෙනා ක්‍රියාත්මක වන්නේ යම් කිසි අලිඛිත එකඟත්වයක් පාදක කර ගෙනය. එම එකඟතාවය අලිඛිත-රහසිගත ස්වරූපයකින් පවතී (ජිජැක් 2005: 277). යම්කිසි ආකාරයකින් දේශපාලන ව්‍යාපාරයක් අභ්‍යන්තරයෙහි පවත්වා ගෙන යන මෙම රහසිගත එකඟතාවයන් විසින් එම පක්‍ෂයේ ක්‍රියාත්මකභාවය පක්‍ෂයෙන් එළියේ ජීවත්වන මිනිසුන් වෙනුවෙන් ප්‍රතිඵලාත්මක ආකාරයෙන් ව්‍යුහගත කරන අතර එවන් මෙහෙයුම් ක්‍රමයක් නොමැතිව බාහිර සමාජය වෙනුවෙන් අර්ථයක් (meaning) නිෂ්පාදනය කිරීම දුෂ්කර බව යම්කිසි දෙයක 'මතුපිට පෙනුම' සම්බන්ධයෙන් අදහස් දක්වමින් ස්ලොවෝයි ජිජැක් කියා සිටී. මෑත කාලයේ ඇතැම් විශ්වවිද්‍යාල උගතුන් විසින් 'මතුපිට අර්බුදයට යැවීමක්' ගැන අදහස් පල කල ද (විශේෂයෙන් මෑතක දී ඉස්මතු වූ රොක් ප්‍රවණතාවය සම්බන්ධයෙන්) අභ්‍යන්තරය තරම්ම වැදගත්කමක් මතුපිට විසින් ද කරන බව ජිජැක් තම ලේඛනයන්හි දක්වා සිටී. හේතුව අප ජීවත්වන සමාජයේ සංකේතීය පිළිවෙල පවත්වා ගෙන යනු ලබන්නේ මතුපිට පෙනෙන එකඟතාවයන් හරහාය. එය අභියෝගයට ලක්කල විට (නැත්නම් අධිරාජ්‍යයා නිරුවතින් බව කියා සිටීමට පටන්ගත විට) සමාජීය සංකේතීය පිළිවෙල බිඳ වැටීමට පටන් ගනී[2]. (වරක් දීප්ති රාජපක්‍ෂවරුන් සම්බන්දයෙන් වූ ගං කබරයින් කතාවට විරුද්ධ වූ විට ඒ සම්බන්ධයෙන් කිසිවෙක් පක්‍ෂව අදහස් දැක්වීමට ඉදිරිපත් නොවුයේ

[2] වර්චුවල් අවකාශයේ අප අත්විදින පාර-ප්‍රපංචයීය 'නිදහස' (trans-phenominological freedom) සත්‍ය වශයෙන් ඇස්බැන්දුමකි. නැතහොත් ලිවීමෙහි ව්‍යාජ-විකෘතිකරණ ලද නියෝජනයකි. අපට ඇතැම්විට 'ගරු ඇමතිතුමණි', 'ගරුතර ස්වාමීන් වහන්ස' නැතහොත් 'විනිශ්චයකාර තුමණි' වැනි වදන් අද්‍යතන වර්චුවල් මාධ්‍ය අවකාශය තුළ (රජයේ මාධ්‍යවල හැර) දක්නට නොලැබේ. විශේෂයෙන් සමකාලීන දේශපාලඥයින් සම්බන්දයෙන් ඇත්තේ ඉතාම අශ්ශිල භාෂා භාවිතයකි. ඔවුන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් අපගේ විරෝධය ඉතාම සාධාරණය. නමුත් 'බැලු බැල්ම (appearance) අර්බුදයට යවනවා' වෙනුවට එය අප ආරක්‍ෂා කර ගත යුතු වන්නේ අප එයට බාධා කළහොත් සමාජ යතාර්ථය ම (social reality itself) බිඳ වැටෙන හෙයිනි. රාජපක්‍ෂවරුන් සම්බන්ධයෙන් ලංකාවේ වාරණය කර ඇති ප්‍රවෘත්ති වෙබ් අඩවියක් විසින් භාවිතා කළ වචනයක් සම්බන්දයෙන් වරක් ත්‍රිමාන වෙබ් අඩවිය කළ විරෝධය කිසිවකුට නොවැටහුනේ මේ කරුණ නොතේරුණ නිසාය. දූෂණය, මර්ධනය, අධිපතිත්වය සහිත දුෂ්ඨ දේශපාලනය කොන්දේසි විරහිතව විවේචනය කල යුතු වුව ද සමාජය සම්බන්ද අපගේ 'අතිමූලික ෆැන්ටසිය' බැඳවැටීම තුළින් මුණ ගැසේන්නේ දරා ගත නොහැකි හිස් බවක් පමණි (void).

මෙම තත්වය බැරෑරුම් ලෙස තේරුම් නොගත් නිසා විය හැක.) එසේ බිඳවැටුනායින් පසුව ගොඩ නැගීමට කිසිවකුට කිසිවක් ඉතුරු නොවන බව අප ඉතා ඉක්මනින් තේරුම් ගත යුතු වෙමු. දීප්ති සම්බන්ධයෙන් ගෙන එන ප්‍රහාරාත්මක ප්‍රවේශයන් විසින් බලපතල හානියක් දීප්තිගේ ප්‍රතිරූපයට සිදු නොවුනා වුව ද එම ප්‍රවේශයේ ඇති භායානකත්වය නම් (රනිල්ට ගෙන එන විවේචන මතු නොව වර්තමාන පාලකයන් සම්බන්ධයෙන් ගෙන එන අශ්ශීල ප්‍රතිචාරාත්මක විවේචයන්ගේ පවා) සමස්තය කිසිදා ප්‍රතිසංස්කරණය කළ නොහැකි අයුරින් බිඳවැටීමට ඇති අවදානමයි. වෙනත් විදියකින් කිවහොත් ආශාවේ වස්තුව විනාශවීමෙන් නොනැවතී 'ආශාව' යන්න ම විනාශවීමට ඇති ශක්‍යතාවය සංකේතීය පිළිවෙළ බිඳවැටීම තුළ සිදු වෙයි යන්න මෙහි සරල අර්ථය යි.

තමා දේශපාලනිකව විනාශ කිරීමට උත්සාහ කළ අය සමග 'සාකච්ඡා කිරීම' ප්‍රතික්ෂේප කිරීම මඟින් මෙන්ම තමාව විශ්වාස කළ අයගේ නායකයා ලෙස පෙනී සිටීමට තීරණය කිරීම මඟින් (බලයට කෑදර ඒකාධිපතිත්වයක් ඉස්මතු වේ යැයි වන ලිබරල් දෘෂ්ටිමය උගුලට (ideological trap) හසු නොවී) දීප්ති කර ඇත්තේ කුමක් ද? එනම් ආචාරධාර්මික ස්වයං-පරිත්‍යාගයක් (moralistic self-sacrifice) කරමින් පසුබැසීමට තීරණය නොකිරීම තුළ සංකේතීයකරණයේ විරුද්ධාභාෂී සාර්ථකභාවය (paradoxical achievement of symbolization) නම් අභිනය ඔස්සේ විරුද්ධවාදීයා තෘප්තිමත් කිරීම ප්‍රතික්ෂේප කිරීමයි. මෙය දීප්ති පාර්ශවය සම්බන්ධයෙන් එක්තරා ස්වරූපරාගීත්වයක් (narcissistic act) පෙන්නුම් කරයි. (වෙන්වීමේ මොහොතෙන් පසු දීප්ති සම්බන්ධයෙන් වන ප්‍රධාන විවේචනයේ පසුබිම ද මෙයයි).

තමා දේශපාලනිකව විනාශ කිරීමට තැත්කල, තම දේශපාලන ව්‍යාපෘතිය පාවාදුන්, තමා එක්තරා කාලයක විශ්වාස කළ නිසාම අශ්ශිල චෝදනාවන් සඳහා අවකාශය විවරකර දුන් අතීත නාසිස්මික තුවාලයක වේදනාව වෙනුවෙන් පළිය ගැනීම (vengeance) මෙම ස්වයං-පරිත්‍යාගී පසුබැසීම (withdrawal) ප්‍රතික්ෂේප කිරීම හරහා එක්තරා 'ආගමික' ආකාරයකට දීප්ති අත්පත් කර ගනී (එය ඔහුට ආදරය කරන අනෙක් අය සම්බන්දයෙන් ද අදාලය). මෙය හරියටම කැසබලන්කා චිත්‍රපටියේ බොගාට් විසින් බර්ග්මන්ව ප්‍රතික්ෂේප කිරීමට සමානය. තමා පැරිසියේ ඇය වෙනුවෙන් කළ කැපකිරීම ඇය විසින් නොතකා හැරීමේ කෝපය ඔහු පිටකරන්නේ කැසබලන්කා හිදී ඇයගේ ඔහු වෙනුවෙන් ඇති ආදරය පාපොච්චාරණ කිරීමට සලස්වා ඇයට පෙරළා ඇයගේ ස්වාමිපුරුෂයා ලඟටම යෑමට සැලැස්වීම මඟිනි. 'ඔබට දැන් මා අවශ්‍ය වුව ද දැන් ඔබට මා ලැබෙන්නේ නැත' යන පණිවුඩය පළිගන්නා සුළු ආකාරයට ඇයට සන්නිවේදනය කර තම ගිණුම පියවා තමාට ඇය නැතිව වුව ද තම ව්‍යාපෘතිය දිගටම කර ගෙන යා හැකි යැයි ඔප්පු කර පෙන්වා ඇත. ඒ ඔස්සේ ඇයගේ ආදරය ලැබීමට තරම් තමා වටිනා පුද්ගලයෙක් බව 'පුරුෂ සංකේතීය අනන්‍යතාවයක්' ගොඩනැගීම ඔස්සේ බොගාට් ඔප්පු කිරීම චිත්‍රපටයේ අවසානය තුළ අපට විද්‍යාමාන වෙයි. දීප්ති සිදුකර ඇත්තේ මෙම 'පුරුෂ සංකේතීය අනන්‍යතාවය' (male symbolic identity) ගොඩනැගීම ඔස්සේ තම දේශපාලන ව්‍යාපෘතිය, පුද්ගල තෘප්තිය වෙනුවට අධිනිශ්චය කිරීම හරහා හැර ගියවුන්ගේ ආදරය ලැබීමට තරම් තමා වටිනා බව පෙන්වීම නම් සංකේතීය/ දේශපාලනික ක්‍රියාවයි.

මෙම ලිපියේ සමස්ත සාරය පහත සඳහන් කරුණු දෙකට සම්පිණ්ඩනය කළ හැක.

i. මේ වන විටත් දෙන ලද පසු-ධනේශ්වර තත්වයන් තුළ දීප්ති තෝරා ගැනීම යනුම බලහත්කාරී වරණයකි. දිප්ති වෙනුවට තෝරා ගැනීම ඇති අනුප්‍රාප්තිකත්වය යනුම මේ වන විටත් සංකේතීයව ප්‍රතික්ෂේප කිරීමට ඇති අභිනයකි.

ii. නිදහසේ තෝරා ගැනීම සඳහා දීප්ති පසු නොබැසීමට තීරණය කිරීම ඔස්සේ විරුද්ධවාදීන් බලාපොරොත්තු වූ 'තෘප්තිය' ලබා නොදීම ඔස්සේ (ආචාරධාර්මික ලිබරල් දෘෂ්ටිමය උගුල) විරුද්ධාභාෂී ආකාරයෙන් (දීප්ති ඇත්තටම ආචාරධාර්මික ද යන පැනයට පිළිතුරු දීම දේශපාලනිකව පමා කිරීම) පුරුෂ සංකේතීයකරණයක් අත්පත් කර ගෙන ඇත.

මෙම දෙවැනි කරුණ සම්බන්දයෙන් පැන නැගී ඇති නොවිසඳුනු තත්වය නිසා දීප්තිගේ (මෙන්ම ශ්‍රී ලංකා පෙරටුගාමී පක්ෂයේ) විරුද්ධවාදීන් සම්බන්දයෙන් වන කොන්දේසි විරහිත ප්‍රහාරයන් 'ආචාරධාර්මික ලෙස ප්‍රශ්න කිරීම' ජයම්පති බුලත්සිංහල සහ අජිත් පැරකුම් ජයසිංහ තාවකාලිකව තෝරා ගෙන 'සතුටක්' ලබයි. දීප්ති ලැබූ 'පුරුෂ, පළිගන්නා සුළු, නාසිස්මික ජයග්‍රහණය' අතික්‍රමණය කිරීමට නොහැකිවීම තුල 'පුරුෂ දේශපාලනයෙන් ඉවත් වී බොහෝ කල්' බව මුළු සමාජයටම ඇසෙන සේ කීමට ජයම්පති බුලත්සිංහලට සිදු වී තිබේ. ජයම්පතිට කිසිදා නොහැකි වූ එහෙත් දීප්ති අසීරුවෙන් නමුත් දක්ෂ ලෙස අත්කරගනු ලැබූ ජිජැකියානු ජයග්‍රහණය ක්ෂිතිමය අත්දැකීමක් වන්නේ මේ අයුරිනි. (හරියටම කියවන්න ජිජැක් 2005: 276-277).

ඊඩිපස් සංකීර්ණය පිළිබඳව යම් සබුද්ධික දැනුමක් ඇති රෝගියකු (පැරණි x සමාජිකයින් අවම වශයෙන් ඊඩිපස් සංකීර්ණය පිළිබඳව දැනුවත් යැයි යන උපකල්පනය මත) මනෝවිශ්ලේෂකයෙක් හමු වී මෙසේ පැවසුවා යැයි සිතන්න. ඊයේ රාත්‍රියේ මම මකරෙකු මරා ඝන වනාන්තරයක් ඔස්සේ පැමිණ මාලිගාවකට ඇතුළුව වුවා. විශ්ලේෂකයා ජයග්‍රාහීව මෙසේ පිළිතුරු දෙනු ඇත. 'මූලික වශයෙන්ම, මා ප්‍රිය රෝගිය, මකරා කියන්නේ ඔබේ පියා. ඉතින් සිහිනයෙන් කියන්නේ මේ වගේ දෙයක්. මවගේ සුරක්ෂිත දිව්‍ය මාලිගාවට නැවත ගමන් කිරීම වෙනුවෙන් තමයි ඔබ ඔබේ පියාව මරා දමල තියෙන්නේ'. මෙතනදී සිදුවන දෙය තමයි මේ වනවිටත් ඊඩිපස් ක්‍රියාව සම්බන්දයෙන් අවබෝධයක් ඇති 'රෝගියා' විසින් තම දැනුම නොසැලකිල්ලට භාජනය කර තිබීම. එවන් රෝගියකුගේ සබුද්ධික දැනුම විසින් ඔහුගේ ව්‍යභිචාරය පිළිබඳ සිහිනය ඉතා සංකීර්ණ ලෙස විකෘති කරනු ලැබීම නිසා එවැන්නකුගේ අවිඥාණය, සම්ප්‍රදායික මනෝවිශ්ලේෂී අර්ථයෙන්, බරපතල ලෙස තම ආශාව සැඟවීම සඳහා සංකීර්ණ ලෙස කටයුතු කරයි. එම සංකීර්ණ බව හා නොසැලකිල්ල විසින් වඩා ශුද්ධ (purer) රෝග ලක්ෂණයක් නිෂ්පාදනය කරනු ඇතැයි සම්ප්‍රදායික විශ්ලේෂකයා පූර්ව අනුමානය කරයි. එවිට මෙම 'දැනුවත් රෝගීන්' තමාගේ රෝග ලක්ෂණය ලැකානියානු විශ්ලේෂයෙන් පමණක් අර්ථකතනය කළ නොහැකි යයි කියන විටම සිදුවන්නේ ඒවා රෝග ලක්ෂණය විසින්ම ලැකානියානු විමය. (symptoms which are in themselves Lacanian). මෙම ලැකානියානු අර්ථකතනය හා තම රෝගීභාවය සම්බන්ධයෙන් රෝගියා ගොඩනගන දුර විසින් ම විෂය නරුමවාදයක් කරා (මා කරන දෙය ගැන මා දැනුවත් නමුත් මා එම දෙයම කරමින් සිටිම) තල්ලු වීම මෙහිදී සිදුවේ. සරළව කිවහොත් මොවුන් තමන් පීතෘ ඝාතකයින් බව නොදන්නා අහිංසකයින් නොවේ.

> 'ස්වාමි-හැඟවුමක් යනු පූර්වයෙන් පැවති තත්වයන් පිළිබඳ අර්ථයක් සපයන සරල අනුභූතික ගුණාංගයක් නොව පවතින තත්වයන් මුල්වරට විද්‍යාමාන කරන නියෝජනය කළ නොහැකි හැඟවුමක් පිළිබඳ රැඩිකල් උපන්‍යාසයකි. (ජිජැක්: 2005: 371)

-----------------------------------------------------------------------------------------------

අපේ යුගයේ වඩාත්ම සංකේතීය දේශපාලන ක්‍රියාදරයෙක් වෙනුවෙන් සහ ලාංකික වාමවාදී රැඩිකල් දේශපාලනයේ අනාගතය පිළිබඳව ලියවෙන ලිපි මාලාවක පළමුවැන්න මෙය වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ජිජැක්, ස්ලෙවොයි (2008). *Enjoy your Symptom*. Verso. London/New York.

ජිජැක්, ස්ලෙවොයි (2005). *Interrogating the Real*. Continuum. New York.

ජිජැක්, ස්ලෙවොයි (1989). *The Sublime Object of Ideology*. Verso. London

ස්ටයිරන්, විලියම් (1979). *Sophie’s Choice*, Random House. London.